


https://youtu.be/h9Nab2cmr1s

ඉතාම මිහිරි ගියක්. නාලක ඔබේ හදබැඳී ගී තනුව සහ සංගිත සංයෝජනය වගේම කාංචනමාලා සොහොයුරියගෙ ගැයුමත් ඉතාම රසවත්. ඒවගේම ගිතයේ කියවෙන අදහසටම සමිප වන ආකාරයෙන් නිර්මාණය කළ මියුසික් වීඩියෝවත් හරිම නිර්මානාත්මකයි. කාංචනමාලා සොහොයුරියට  අගනා ගිත සංයුක්ත තැටියක් එළිදක්වන්න හැකිවේවා.. -- Dayananda Rathnayake

ඉතා අපූරු ගීතයක්.
මගේ උණුසුම් සුබපැතුම්!!
ජයමවේවා! -- Janaka Kumbukage

පද මාලාව - අරුණෝදය තුල උපයෝගිකොට ගතහැකි හැම සංසිද්ධියක්ම යොදාගෙන රසවත්ව පෙල ගන්වලා.
සංගීතය.. ඉතාම උචිත බවක් දනවනවා..පදවලින් ද්වනිථ වන අරුත පිරිපුන් කරන්නට. ඒවාගෙම සරළ වුවත් මිහිරක් ජනනය කර තිබෙනව..අංජන කුමාර ගේ විශේෂ අනන්‍යතාවය මතුකරමින්.
ගායනය; මිහිරියි..හඬ ..ලයාන්විතයි..ගායන විලාශය..පදවල අරුත් තවත් තීව්‍ර කරණව.
රූප රචනය. ගැයෙන අදහස හා සංකල්පනාවන්..රූපමය වශයෙන් මතුකරන්නට සමත්... ප්‍රසන්න සොඳුරු දසුන් ..අරුණෝදයේ..හිරුනැගෙන පරිසරය මැනවින් යොදාගෙන තියෙනව.

කාන්චනමාලාවන් , ගායනයට පමණක් නොව රූපණයට ද කුසලතා ඇතිබවට කදිම නිදසුනක් ඇය වීඩියෝවට ඉදිරිපත් කරණ රූපනය... එය ජානමය උරුමයක් විය හැකියි ඇය සතු නිසග කුසලතාවයට අමතරව..

ස්තූතියි ..!! එවැනි රසවත් ගීතමය වින්දනයක් ලබන්නට මටද අවස්ථාවක් ලබා දුන්නාට.
මගෙ හදපිරි සුබ පැතුම්..!!! - Buddadhasa Vithanachchci

“නටන හිරු හට” නම් වූ මේ නිර්මාණය, ස්වභාවධර්මයේ චමත්කාරයට හද්‍ර යෞවනයේ මෝදු වන්නාවූ හෘදය සංවේදී නිර්ව්‍යාජ ප්‍රේමය ද, එකී ප්‍රේමයෙන්ම ජනිත වන්නාවූ ශෘංගාර රසයද, තවරා, රසිකයා තුළ ප්‍රේමණීය වින්දනයක් ජනිත කරවන්නා වූ, Priyantha Kulasekera නම් වූ ගී පද රචකයා මෙතෙක් කර ඇති නිර්මාණ වලින් සාර්ථකම නිර්මාණයයි.
කවියෙකු ගීපද රචකයෙකු වීමේදී බොහෝවිට සිදුවන අඩුලුහුඩුකම් ප්‍රියන්ත බණ්ඩාර කුලසේකර නම් අපේ මිතුරා මේ නිර්මාණයේදී අවම කොටගෙන ඇති බව මගේ හැඟීමයි.
වසත් සමයේ අරුණ උදයක සුන්දරත්වය කෙතරම් ද, ප්‍රේමයෙන් පිපිදෙන්නා වූ යෞවනයත් ඒ තරම්ම සුන්දරයි. මල් පිපුණු උදෑසන, ලා දළු මත, මල් මත හිරු එළියේ හිනැහෙන පිනි බිඳුවල විචිත්‍රත්වය වැනි සොබාදහමේ සුන්දර දායාදයන්ට, පිබිදෙන යෞවනය හා ප්‍රේමය සම කරන ගී පද රචකයා, කවියා, ඔහුගේ හදවතේ උපන් හැඟීම් මේ නිර්මාණයෙන් මවන විචිත්‍ර චිත්‍රය අතිශය චමත්කාර ජනකයි.
සුගායනීය ගී පද හා රචනය පුරාවට ඇති ගේයතා ගුණය, විශාරද නාලක අංජන කුමාරයන්ගේ අපූර්වතර සංගීත නිර්මාණයටත්, කාංචනමාලා රණසිංහයන්ගේ භාව පූර්ණ ගායනා ලීලාවටත් උත්තේජනයක් වූ වග අමුතුවෙන් කිව යුතු නැත. ඇගේ මිහිරි කටහඬ තුළ නින්නාද වන්නේ ඒ ආදරයේ සනාතන සුන්දරත්වයයි. නාලක අංජන කුමාරයන්ගේ මිහිරි මියැසිය තුළ නින්නාද වන්නේද ඒ යෞවන ප්‍රේමයේ ස්වරයමයි.
කවිය හෝ ගීතය යන්නට පරිපූර්ණ වූ නිර්වචනයක් කිරීමට තරම් ගැඹුරට මම ඒ කලාව හදාරලා නැහැ. ඒත් සාමාන්‍ය රසිකයෙකු විදියට, හෘදය සංවේදී නිර්ව්‍යාජ ප්‍රේමයේ  චමත්කාරය මතු කරනු පිණිස මැනවින් තෝරාගත් රමණීය ගී පද, රසික හදවත් තුළ ඉහළම චමත්කාරයක් ජනනය වන අයුරින් රමණීය ලෙස ගැළපීම මේ නිර්මාණයේ පුරාවට ඇතැයි මට දැනෙනවා. ඒ බව කාංචනමාලා රණසිංහයන්ගේ භාව පූර්ණ ගායනා ලීලාවෙනුත්, එකී ගායනයේදී ඇගේ අංග චලනයෙනුත්, ඇගේ මුහුණේ ලියැවී ඇති සාත්වික අභිනයෙන්ද දයාබර රසික ඔබට වැටහේවි. මේ ගායන කුසලතාවයෙන් හා ප්‍රතිභාවෙන් ඇට ගායනවේදිණියක ලෙස දුර ගමනක් යා හැකි බව පැහැදිලියි. ඇගේ මවගෙන් ඇට ජන්මයෙන් ලැබුණු කුසලතාවය ද ඒ සඳහා ඇට අපරිමේය ශක්තියක් හා දිරියක් වනු ඇත.
මේ ගීතයේ රූප රචනයෙන් මේ නිර්මාණයට දී ඇති වර්ණයද අති විශිෂ්ඨයි. එහිදී Teanath Roshan හා Sanjaya Hemasiri දෙපලගේ කලා හැකියාවන් පැසැසිය යුතුමය.
දයාබර සොයුරු සොයුරියණි, ඔබේ නිර්මාණයේ මිහිරියාව පසුගිය මාසය පුරාවට අප අත්වින්දෙමු. ඒ ඉදිරියටද අපට මිරියාවක්ම වේවි.
සැමට ජය!

Don Susil Premaratne
Ottawa ON, Canada